**ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

--------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් **03** දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කලමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1(ආ) ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

----------------------------------------------

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවන් පහත පරිදි දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104(4) | හානියක් සිදු වූ දිනයේ සිට තුන්මසක් ඇතුළත පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වාහන 04 කට අදාළ පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මාස 05 සිට වර්ෂ 05 දක්වා වූ අතර 2018 හා 2019 වර්ෂවලදී අනතුරට ලක් වූ වාහන 03 ක පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කළ යුතුය. | මු.රෙ.104(4) ප්‍රකාරව පූර්ණ වාර්තා සකස් කිරීමේදී බාහිර වෙනත් ආයතනවලින් තොරතුරු ලබා ගැනීමට සිදු වීම නිසා ප්‍රමාද වේ. පූර්ණ වාර්තා සකස්කළ හැකි අනතුරු වලට අදාළ වාර්තා සකස් කරමින් පවතී. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසු හෝ යන කරුණු අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, වාහන 21 කට අදාළ ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා කඩිනම් ඔප්පු වැඩසටහන හේතුවෙන් ඉන්ධන පරික්ෂාව සඳහා වාහන යෙදවීමට නොහැකි විය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ආදායම් සංකේත 20.02.01.03 යටතේ අන්තර් පළාත් ගොවිජනපද ප්‍රදේශයන්හි ඉඩම් බදු ආදායම් රැස් කිරීම් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු. 28,746,016 ක හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු. 175(2) හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛනයේ 4(ආ) ඡේදය ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීම හා සමුච්චිත හිඟ ආදායම ඉහළ යාම පාලනය සඳහා ක්ෂණික පියවර ගත යුතුය. | රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදු දීමේ ක්‍රමවේදය පනත ප්‍රකාරව සංකීර්ණ ක්‍රියාවලියක් වන බැවින් බදුකරුවන් තෝරාගත් දිනයේ සිට බදුකරයක් නිකුත් කිරීම දක්වා කාලය වෙනුවෙන් හිඟ බද්දක් නිර්මාණය වී බදු කරුවන් ගෙවිය යුතු බදු මුදල විශාල අගයක් ගෙන ඇත. හිඟ බදු අයකොට බදු ආදායම් ශක්තිමත් කිරීමට වැඩ පිළිවෙලක් ඉදිරි කාලවලදී ක්‍රියාත්මක වන අතර බදු ආදායම් ක්‍රමවත්ව අය වනු ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අන්තර් පළාත් ගොවි ජනපද ප්‍රදේශයන්හි රජයේ ඉඩම් වලින් රැස් කළ යුතු හිඟ බදු ආදායමෙන් සියයට 47 ක්ම වර්ෂ 02 කට අධික කාලයක සිට හිඟව පැවතුණු අතර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 07 කට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක පූර්ව වර්ෂය හා සැසඳීමේදී රු.7,910,261ක හිඟ ආදායම් සංචලනය නොවී පැවතුණි. | රජයේ ඉඩම්වල බදු ආදායම් කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කළ යුතුය. | හිඟ බදු අයකොට බදු ආදායම ශක්තිමත් කිරීමට වැඩ පිළිවෙලක් ඉදිරි කාල වලදී ක්‍රියාත්මක වන අතර ඒ අනුව බදු ආදායම් ක්‍රමවත්ව අය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | අන්තර් පළාත් ගොවිජනපද ප්‍රදේශයන්හි හැර සෙසු ප්‍රදේශවල බදු ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර එම ප්‍රදේශවල රජයේ ඉඩම් පරිපාලනය හා පරිපාලනය සම්බන්ධ නිලධාරීන් අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ බලතල 2010 පෙබරවාරි 03 දිනැති **SP**/ **RD**/02/10 දරන රාජ්‍ය ඉඩම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී තිබුණි. එසේ වුවද, බදු මුදල් අය කිරීමේ අධීක්ෂණ කටයුතු දුර්වල තත්වයක පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 2,913,074,419 ක ආදායමක් අයකරගෙන නොතිබුණි. | රජයේ ඉඩම් ආඥා පනතේ 91 වගන්තිය**,** 2010 පෙබරවාරි 03 දිනැති **SP**/ **RD**/02/10 දරන රාජ්‍ය ඉඩම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ආදායම් අයකර ගැනීමට හා අය වීමට ඇති හිඟ ආදායම් සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු කළ යුතුය. | බදු දීමේ ක්‍රියාවලියේ සංකීර්ණතාවය නිසා විශාල බදු මුදලක් හා දඩ මුදලක් එකතු වී ඇත. බදු සහන ලබාදීම තුළින් බදු එකතු කිරීම කඩිනමින් සිදු කිරීමට කටයුතු අරඹා ඇත. |

## 2.2. වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයාංක 286-02-01-1409 (වෙනත් සේවා) සඳහා වූ රු.50,000,000ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.1,502,000 ක මුදලක්, වැය විෂයයට අදාළ වියදම් පිළිබඳ නිවැරදි ඇස්තමේන්තුවකින් තොරව මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරු කිරීම හේතුවෙන් වර්ෂය අවසානයේ ඉතිරිය වූ රු.2,406,124 ඉක්මවූ බැරකම් වටිනාකම රු.1,172,554 ක් වී තිබුණි. | විධිමත් අයවැය කළමනාකරණයක් සිදුකළ යුතුවීම. | මහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් නිදහස් කිරීම සීමා සහිත වූ බැවින් අත්‍යාවශ්‍යය වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන මාරු කර ඇත. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව සලසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා වියදමක් හෝ බැඳීමක් ඇතිකර නොගත යුතු වුවත් වැය විෂයයන් 06 ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.1,900,682 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සලසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා වියදමක් හෝ බැඳීමක් ඇති කර නොගත යුතුය. | දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වා ගැනීම සඳහා අනිවාර්යෙන්ම සිදු කළ යුතු අත්‍යාවශ්‍ය කාරණා හේතුවෙන් ගෙවීම් කිරීමට සිදු වූ බව හා ඉදිරියේ දී ප්‍රතිපාදන ඉක්මවා බැරකම් පවත්වා නොගැනීමට සටහන් කරගෙන ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 03 දිනැති 271/2019 අංක දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාරයට වාර්තා නොකළ බැඳීම් හෝ බැරකම් පෙර වර්ෂයේ වියදම් ලෙස 2020 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු රු.684,103 ක බැරකම් 2020 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රු.654,342 ක බැරකම් අතපසු වීමකින් ඇතුළත්ව නොමැති බව හා බැරකම් අනුමාන කර බැරකම් ලේඛනයට ඇතුළත් කිරීමේදී රු.29,761 ක් අඩුවෙන් සටහන් කර ඇත. |

**2.4** තැන්පත් ශේෂයන්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2019 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.68,156,632 කි. ඒ තුළ පවතින වර්ෂ 02 ඉක්ම වූ එකතුව රු.66,460,406 ක් වූ තැන්පතු 48 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබිණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මිහිකත මැදුර ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව රඳවාගත් මුදල්වලින් ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු වල පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය හෙයින් රැඳවුම් මුදල් නිදහස් කර නොමැත. |

**2.5** රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවය අතහැරගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් එකතුව රු.157,894 ක් වූ ආපදා හා උත්සව අත්තිකාරම් ණය ශේෂයන් වර්ෂ 03 සිට 04 දක්වා කාල පරාසයක වූ අතර, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 4.6 වගන්තිය ප්‍රකාරව ශේෂ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | මුදල් වහාම පියවීමට කටයුතු කරන ලෙස දන්වා නිලධාරීන් වෙත ලිපි යොමු කර ඇතත් පිළිතුරු සපයා නැත. ප්‍රාදේශීය ලේකම් වෙතින් මෙම නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු විමසා ඇති බව දන්වමි |
| (ආ) | වැඩ තහනම් කළ නිලධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් රු.406,509 ක හිඟ ණය ශේෂයක් වර්ෂ 05 සිට වර්ෂ 13 දක්වා කාල පරාසයක සිට ඉදිරියට ගෙන එමින් තිබුණි. | ආයතන සංග්‍රහයේ **XLVII** පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර ණය ශේෂ අයකර ගැනීමටද කටයුතු කළ යුතුය. | රජයට අයවිය යුතු ණය ශේෂ වාරික වශයෙන් හෝ ගෙවීමට කටයුතු යොදන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙස අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල වෙත දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| "රාජ්‍ය ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස නිරවුල් බිමක් හිමි සමාජයක් බිහි කිරීම " යන දැක්ම හා "ජාතික ප්‍රතිපත්තියක් තුළ මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ චිරස්ථායි බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට මග පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාම" දෙපාර්තමේන්තුවේ මෙහෙවර විය. මෙම මෙහෙවර සාක්ෂාත් කරගැනීමට දෙපාර්තමේන්තුවේ කළමනාකරණයට අයත් ඉඩම් ප්‍රමාණය හා ඉන් බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන ලේඛනයක් සකස් කර යාවත්කාලීන කිරීමට කටයුතු නොකිරීම නිසා අනවසර පදිංචිකරුවන් හඳුනා ගැනීමට හා ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර මත පදනම් වූ කළමනාකරණයක් පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවේ පාලනයට යටත් ඉඩම් ප්‍රමාණය, ඉන් බැහැරකර ඇති ප්‍රමාණය හා අනවසර භාවිතයේ පවතින ඉඩම් පිළිබඳ නිවැරදි තොරතුරු පවත්වාගෙන යා යුතු වේ. | 1897 මුදු බිම් පනත මඟින් ලියකියවිලි වලින් තහවුරු කිරීමට නොහැකි සියලුම ඉඩම් රජයේ ඉඩම් ලෙස සලකා ඇත. ඉන්පසු 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත , 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනත , 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ආදී පනත් මඟින් රාජකාරී කටයුතු කළද සමස්ත රජයේ ඉඩම් මැනීමක් සිදුවී නැති අතර ඊට අදාළ දත්ත පද්ධතියක් සකස් කර නොමැත. දෙපාර්තමේන්තුව විසින් ඉඩම්වල භාරකාරත්වය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පවරා ඇති බැවින් බැහැර කරන ලද රජයේ ඉඩම් තොරතුරුවල සම්පිණ්ඩනයක් දෙපාර්තමේන්තුව සතුව පවතී. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රජයේ ඉඩම් පිළිබඳව දත්ත පද්ධතිය සකස් කිරීම වෙනුවෙන් රු.129,984,715 ක පිරිවැයක් දරා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත්තේ ඉඩම් ලේඛන 1180632 ක තොරතුරු පමණි. 2019 වර්ෂයේදී ඉඩම් ලේඛන 200000 ක් ඇතුළත් කිරීමට සැලසුම් කළද දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත්තේ ඉඩම් ලේඛන 144936 ක තොරතුරු පමණි. එම නිසා බදු අය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මෙම පද්ධතියෙන් ලබා ගැනීමේ හැකියාවක් නොතිබුණි. | රජයේ ඉඩම් කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි රජයේ ඉඩම් කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. | ඉඩම් පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යෑම ඉතා සංකීර්ණ ක්‍රියාවකි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් අනෙකුත් කාර්යයන් සිදු කරන අතරතුර ඉඩම් සම්බන්ධ දත්ත ඇතුළත් කිරීම සිදු කරන බැවින් ප්‍රමාදයක් සිදුව ඇත. උපාධිධාරීන් අභ්‍යාසලාභීන් බඳවා ගැනීම තුළින් ද්වීතික දත්ත ඇතුළත් කිරීම වේගවත් කර වසර 02 ක් තුළ අවසන් කිරීමට වැඩසටහනක් සකස් කර ඇත. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් භූමියක 2017 වර්ෂයේදී රු.මිලියන 36.4 ක් වැය කර ඉදි කරන ලද ඉඩම් කොමසාරිස් ජනරාල් නිල නිවස ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සහ පරිසර අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ඉදිකර තිබීමෙන් ගොඩනැඟිල්ල වටා ජලය රැස් වීම හේතුවෙන් වර්ෂ 02 කට වැඩි කාලයක් භාවිතයෙන් තොරව පැවතුණි. තවද මෙම නිල නිවස මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා ඇතත් මෙතෙක් මෙම ගොඩනැගිල්ල ඉදි කරන ලද ඉඩම පවරාගෙන නොතිබුණි. | ඉඩම පවරා ගැනීමට හා ගොඩනැඟිල්ල භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව ලවා භූමිය සකසා භාවිතයට ගැනීමට කටයුතු කරන අතර මෙතෙක් ඉඩම පවරා ගැනීමට අදාළ නිර්දේශ වාර්තා දෙපාර්තමේන්තුව වෙත ලැබී නැත. |
| **(ආ)** | 2017 ජුනි 28 දිනැති 01/2017 , 2018 මාර්තු 19 දිනැති 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 2018 ජුනි 30 දිනට පෙර අපහරණය කළ යුතු වුවත් අපහරණ සඳහා තීරණය කරන ලද වාහන 04 ක් වර්ෂ03 සිට 04 දක්වා කාලයක සිට නිෂ්කාර්යව පැවැතුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 54 – 4013, 54 - 4012 හා **KH - 569**4 අංක දරන වාහන 03 අලුත්වැඩියා කර ධාවනය සඳහා යෙදවීමට කටයුතු කරනු ලැබේ. 32 - 3295 ,32 - 1187අංක දරන වාහන 02 වෙනත් රාජ්‍ය ආයතනයකට ලබාදීමට හෝ අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සංචාරක නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා පුද්ගලික සමාගමකට 2006 වර්ෂයේදී වසර 30 ක කාලයක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ අමාත්‍ය මණ්ඩල තීරණයන් මත ලබා දී ඇති මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර් 0.238 ක රජයේ ඉඩම එම බදුකරු විසින්ම 1995 වර්ෂයේ සිටම 2006 වර්ෂය දක්වා වසර 11 ක් අනවසරයෙන් භුක්ති විඳ ඇත. රජයේ තක්සේරුකරුගේ තක්සේරුව අනුව රජයට අහිමි වී ඇති බදු ආදායම රු.6,932,500 ක් | කාලීනව බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හෝටල් සමාගම 1995 වර්ෂයේ සිට ආරම්භ කර ඇතත් මෙම ඉඩම උඩවත්ත කැළයට අයිතිද යන්න තහවුරු කර නොමැති නිසා සමාගම වෙත ඉඩම ලබාදීම ප්‍රමාද විය. අමාත්‍ය මණ්ඩල අනුමතය ලද දිනය බද්ද ආරම්භ කළ දිනය ලෙස සැලකන ලදී. තක්සේරු |

| | | | |
|---|---|---|---|
| | බව නිරීක්ෂණය වේ. ඉඩමේ අයිතිය තහවුරු කර ගෙන නොමැති බව දක්වමින් මෙම අනවසර භුක්තිය පිළිබඳව නෛතික ක්‍රියාමාර්ගවලට අවතීර්ණව නොතිබීම මතභේදාත්මක කරුණක් බව නිරීක්ෂණය විය. | | වාර්තාව මෙතෙක් නොලැබීම හේතුවෙන් නියමිත පරිදි බදු අය කර ගැනීමට නොහැකි විය. |
| (ආ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පර්චස් 29.88 ක රජයේ ඉඩමක් 1999 වර්ෂයේදී දීර්ඝ කාලීන බදු පදනම යටතේ සීමා සහිත ස්වාධීන රූපවාහිනී සේවය වෙත ලබා දී තිබුණද ගෙවියයුතු බදු මුදල දැනුම් දීමට භුක්තිය භාරදුන් දිනයේ සිට වර්ෂ 03 කට ආසන්න කාලයක් ගතවී තිබුණි. තවද භුක්තිය බාරදුන් දිනයේ සිට වර්ෂ 10 ක කාලයක් කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවීමට ඇති හිඟ බදු මුදල රු. 36,225,000 කි. එසේ වුවද ඉඩම් බදු දීමේ දී නීත්‍යානුකූලභාවය ආරක්ෂා වන පරිදි බදුකරයක් නිකුත් කර නොතිබීම හේතුවෙන් බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් බදුකරුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග වලට එළඹීමේ හැකියාවක් නොතිබුණි. | ඉඩම්වල භුක්තිය භාර දුන් වහාම ගෙවිය යුතු බදු මුදල බදුකරු වෙත දැනුම් දිය යුතු වන අතර අප්‍රමාදව අදාල බදුකරු සමඟ නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීම තුළින් හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බදු දීමේ ක්‍රියාවලියේ දී ආයතන කිහිපයක් සම්බන්ධ වන බැවින් සැලකිය යුතු කාලයක් ගත වේ. බදු ගෙවීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් හා බදුකරු සමඟ සාකාච්ඡා කිරීමට තීරණය කර ඇත. |
| (ඇ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර් 1.163 ( පර්චස් 416 ) ක රජයේ ඉඩමක් දීර්ඝකාලීන බදු පදනම යටතේ 1956 වර්ෂයේ සිට වර්ෂ 30 ක කාලයක් සඳහා ඔටර්ස් ඇක්වටික් ක්ලබ් ආයතනය වෙත ලබා දී තිබුණි. ඉන් පසුව වර්ෂ 17 ක කාලයක් බදු ගිවිසුමකින් සහ බදු මුදල් ගෙවීමකින් තොරව අදාළ ඉඩම භුක්තිවිඳ තිබුණි.සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 28,411,250 ක බදු මුදල් හිඟව පැවතුණද බදුකරයක් නිකුත් කර නොතිබීම හේතුවෙන් බදු මුදල් ගෙවීම පැහැරහැරීම සම්බන්ධයෙන් බදුකරුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග වලට එළඹීමේ හැකියාවක් නොතිබුණි. බදුකරයක් නිකුත් නොකිරීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | බදු දෙන ඉඩම් සම්බන්ධයෙන් විධිමත් ලේඛනයක් නඩත්තු කරමින් බදු කාලය අවසන් වූ වහාම කාලය දීර්ඝකල යුතු වන අතර නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීම තුළින් බදු මුදල් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. | බදු කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලීම බදුකරුගේ වගකීමක් වේ. බදු ගිවිසුමේ කාලය දීර්ඝ කිරීම සඳහා අදාළ බදු නිර්දේශ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් ඉදිරිපත් කර ඇත්තේ ප්‍රමාද වී බව දන්වන අතර බදුකාර ආයතනය සමග සාකච්ඡා කිරීමෙන් පසු බදු මුදල් කොටස් වශයෙන් ගෙවීමට එකඟවී ඇත. |
| (ඈ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රූඩ්.01 පර්චස් 17.5 ක හා අක්කර 01 රූඩ් 01 පර්චස් 5.06 ක රජයේ ඉඩමක් දීර්ඝකාලීන බදු පදනම යටතේ පිළිවෙලින් 1977 නොවැම්බර් 30 වන දින හා 1987 ජනවාරි 01 දින සිට වර්ෂ 30 ක කාලයක් සඳහා 80 සමාජය නම් ක්‍රීඩා සමාජය වෙත බදුදී තිබුණු අතර එම කාලය අවසානයේ බදු කාලය දීර්ඝ කිරීමද සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.23,686,320 ක බදු මුදලක් හිඟව පැවතුණද බදුකරයක් නිකුත් කර නොතිබීම හේතුවෙන් බදු මුදල් පැහැර හැරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගවලට එළඹීමේ හැකියාවක් | නීත්‍යානුකූල ගිවිසුමට එළඹීම තුළින් බදු මුදල් රැස්කර ගැනීම කටයුතු කළ යුතුය. | තිඹිරිගස්යාය වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පවතින රජයේ ඉඩම්වල අධික තක්සේරුව හේතුවෙන් ආදායම් ඉපයුවද වාණිජ පදනමක් මත බදු ලබා ගැනීම බදුකරුවන් රුචිකත්වයක් නොදක්වයි. ඉදිරියේදී මෙම තත්ත්වය පිළිබඳ අදාළ ආයතන දැනුවත් කර රාජ්‍ය |

| | | |
|---|---|---|
| නොතිබුණි. බදුකරයක් නිකුත් නොකිරීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | | ආදායමට හිතකර වන ප්‍රතිපත්තියක් සාකච්ඡා කර බදු අය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීමට කටයුතු කර අයවිය යුතු බදු මුදල් කොටස් වශයෙන් ගෙවා අවසන් කිරීමට අවසර ලබා දෙනු ලැබේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ------------------------------- |
| (අ) | දෙපාර්තමේන්තුවේ තනතුරුවල පුරප්පාඩු 315 ක් පැවති අතර,ඒ තුළ ඉඩම් කොමසාරිස් තනතුරු 05 ක් ජනපද නිලධාරී තනතුරු 113 ක් හා සංවර්ධන සහකාර තනතුරු 105 ක් පැවතුණි. එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට බාධා ඇති වියහැකි බවත් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත් සම්පූර්ණ කළ යුතුය. | සියලු නිලධාරීන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් බඳවා ගැනීම සිදු කරන අතර විටින් විට ඉල්ලුම් කළද පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති 2/2018 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා කාර්යමණ්ඩල යොදවනු ලබන ආකාරය පිළිබඳ සැලැස්මක් සකස්කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව සැලසුමක් සකස් කළ යුතුය. | සමාලෝචිත වර්ෂයට අදාළ මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොමැත. |